රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 34/94

මගේ අංකය :- VII 543 ඊ/1143/90
රාජ්‍ය පරිපාලන, පාර්ලිමේන්තු කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994.09.01.

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල
සභාපතිවරුන් වෙත.

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි
සංස්ථාවේ ප්‍රධාන කාර්යාලවලට අනුයුක්ත කාර්ය මණ්ඩලවල
සුදුසුකම් ලැබූ අය රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට/
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයට බඳවා ගැනීම.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව තිබූ වතු කළමණාකරණය පෞද්ගලික අංශයට පැවරීම හේතුවෙන් එම ආයතනවල ප්‍රධාන කාර්යාලවල සිටින කාර්ය මණ්ඩලයට නිශ්චිත රාජකාරියක් නොමැතිව වැටුප් ගෙවීමට සිදුව තිබීම පිළිබඳව සලකා බැලූ අමාත්‍ය මණ්ඩලය 1994.05.11 දින ගනු ලැබූ තීරණය පරිදි එම අය අතුරින් සුදුසුකම් ලබන අය රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට පහත සඳහන් කොන්දේසි අනුගමනය කරමින් බඳවා ගැනීමට ක්‍රියා කළ යුතුය.

I. අනුමත තනතුරු සංඛ්‍යාවේ පුරප්පාඩු තිබිය යුතුය.

II. බඳවා ගැනීමේ පරිපාටි හා ව්‍යවස්ථා අනුව අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

III. පෙර සේවා කාලය විශ්‍රාම වැටුප් කාර්ය සඳහා ගණන් නොගත යුතුය.

IV. රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කළ නොහැකි අය, නියමිත සුදුසුකම් තිබේ නම් රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල තනතුරු සඳහා පත් කිරීමට ක්‍රියා කළ යුතුය.

**02.** අතිරික්ත කාර්ය මණ්ඩලයට අදාළ තනතුරු නාම හා නිලධාරි සංඛ්‍යාව ඇතුලත් ලේඛණයක් මෙයට යාකර ඇත. තමන් බැඳීමට කැමති රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය/සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සේවය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කෙරෙනු ඇත.

**03.** පළමුවන ඡේදය යටතේ අන්තර්ග්‍රහණය කළ නොහැකි අතිරික්ත කාර්ය මණ්ඩලයට වන්දි ගෙවා සේවය අවසන් කිරීමට රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් පියවර ගත යුතුය.

-

**02.** මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ ස්වදේශ කටයුතු හා පළාත් සභා අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/ (ආර්.එස්.ජයරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පාර්ලිමේන්තු කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

-

# තනතුරු නාම සහ අතිරික්ත නිලධාරී සංඛ්‍යාව දැක්වෙන ලේඛනය

| තනතුර | නිලධාරී සංඛ්‍යාව (ඉතිරි) |
|---|---|
| ගණකාධිකාරී | 24 |
| ගිණුම් ලිපිකරු | 15 |
| පාලන සහකාර | 20 |
| වැඩ සටහන් විශ්ලේෂක | 5 |
| සහකාර ගණකාධිකාරී | 1 |
| සහකාර අධ්‍යක්ෂ | 5 |
| සහකාර විදුලි කාර්මික | 1 |
| සහකාර අභ්‍යන්තර විගණක | 20 |
| සහකාර ගබඩා භාරකරු | 5 |
| විගණන ලිපිකරු | 2 |
| පොත් තබන්නා | 38 |
| පෙට්ටි අලුත්වැඩියා කරන්නා | 1 |
| වඩු කාර්මික | 2 |
| මුදල් භාරකරු | 1 |
| පරීක්ෂක | 4 |
| චෙක්පත් ලිපිකරු | 1 |
| චෙක් ලියන්නා | 1 |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 1 |
| ලිපිකරු | 252 |
| ලිපිකරු - ගබඩා | 12 |
| ලිපිකරු - සැලසුම් ශිල්පි | 1 |
| ලිපිකරු/යතුරු ලේඛක | 8 |
| රහස්‍ය ලේකම් | 17 |
| උපදේශක | 1 |
| සහකාර අධ්‍යක්ෂ | 4 |
| අධ්‍යක්ෂ | 6 |
| අධ්‍යක්ෂ - ඉංජිනේරු | 1 |
| අධ්‍යක්ෂ - වෙළෙඳ | 2 |
| සැලසුම් ශිල්පි | 2 |
| රියදුරු | 91 |
| විදුලි කාර්මික | 4 |
| ඉංජිනේරු | 1 |
| ඉංජිනේරු (බී,සි.) | 1 |
| ඉංජිනේරු (ජල සැපයුම්) | 1 |
| ගොනු කිරීමේ ලිපිකරු | 1 |
| ප්‍රධාන කළමනාකරු (ජෙනරල් මැනේජර්) | 1 |

| | |
|---|---|
| ප්‍රධාන කා.කා.ස. | 1 |
| ප්‍රධාන තේ පිළියෙල කරන්නා | 1 |
| සෞඛ්‍ය අධ්‍යාපක | 1 |
| අභ්‍යන්තර විගණක | 1 |
| කණිෂ්ඨ විධායක | 3 |
| කා.කා.ස. | 26 |
| කා.කා.ස./පණිවුඩකරු | 2 |
| කම්කරු | 179 |
| සම්බන්ධතා නිලධාරී | 1 |
| පුස්තකාල සහායක | 1 |
| ලොරි ශුද්ධ කරන්නා | 1 |
| අභ්‍යාසලාභී කළමනාකරු | 1 |
| කළමනාකරු | 17 |
| පෙදරේරු | 1 |
| වෛද්‍ය නිලධාරී | 1 |
| පණිවුඩකරු | 4 |
| සභාපතිගේ පෞද්ගලික සහකාර | 4 |
| පින්තාරුකරු | 1 |
| පියුන් | 47 |
| පියුන්/රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු | 1 |
| පෞද්ගලික නිලධාරී | 1 |
| බෙහෙත්ශාලාකරු | 1 |
| ඡායාරූප ශිල්පී | 1 |
| වැඩසටහන්කරු | 1 |
| ගුවන් විදුලි ක්‍රියාකරවන්නා | 1 |
| ලේ'ඛන භාරකරු | 1 |
| රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු | 1 |
| රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු/කා.කා.ස. | 1 |
| වෙළඳ සහායක | 1 |
| ලේකම් | 9 |
| ආරක්ෂක ගාඩ් | 66 |
| ආරක්ෂක නිලධාරී | 6 |
| ආරක්ෂක අධීක්ෂණ නිලධාරී | 12 |
| ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී | 1 |
| සංඛ්‍යා ලේඛනඥ | 1 |
| ලඝුලේඛක/යතුරු ලේඛක | 9 |
| ලඝුලේඛක/යතුරු ලේඛක (ඉ) | 13 |
| ලඝුලේඛක/යතුරු ලේඛක (සි) | 6 |
| ලඝුලේ'ඛක | 36 |
| ගබඩා භාරකරු | 32 |
| ගබඩා ලිපිකරු | 7 |
| ගබඩා ලිපිකරු/චෙකර් | 1 |
| ගබඩා නිලධාරී | 5 |
| සුපර්වයිසිං ඔපිසර් | 3 |
| සුපර්වයිසර් | 7 |

-

| | |
|---|---|
| සුපර්වයිසර්/ලිපිකරු | 2 |
| තේ පිළියෙල කරන්නා/කා.කා.ස. | 1 |
| තේ රස බලන්නා | 2 |
| කාර්මික සහකාර | 1 |
| දුරකථන ක්‍රියාකරවන්නා | 6 |
| අභ්‍යාස නිලධාරී | 2 |
| යතුරු ලේඛක | 13 |
| යතුරු ලේඛක (පිටපත්) | 2 |
| යතුරු ලේඛක (ඉ) | 15 |
| වීඩියෝ ක්‍රියාකරවන්නා/රියදුරු | 1 |
| ආගන්තුක ආරක්ෂක නිලධාරී | 3 |
| | |
| එකතුව | 1127 |